නිපුනතාව: 12.0 පුද්ගලයන්ගේ හා සංවිධානවල පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීම සඳහා කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පෙන්වා දෙයි.

නිපුනතා මට්ටම: 12.11 මෙහෙයවීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට මනා සන්නිවේදනය ඉවහල් වන ආකාරය පෙන්වා දෙයි

<u>සන්නිවේදනය යනු කුමක්ද?</u>

පාර්ශව දෙකක් හෝ වැඩි ගණනක් හෝ අතර තේරුම් ගත හැකි ආකාරයට තොරතුරු හුවමාරු කර ගැනීම සන්නිවේදනය ලෙස හැඳින්වේ.

<u>සන්නිවේදනයේ වැදගත්කම</u>

- ✓ ආයතනයේ පරමාර්ථ හා අරමුණු ස්ථාපිත කිරීම සඳහා සැලසුම් සකස් කිරීමට.
- ✓ ආයතනයේ කටයුතු මනා ලෙස සංවිධානය කිරීම සඳහා
- ✓ තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට .
- ✓ මානව සම්පත් කළමනාකරණය කිරීම සඳහා.
- ✓ ආයතනයේ සමස්ත පාලන කටයුතු ක්‍රියාත්මක කිරීමට.
- ✓ ආයතනයේ සියලු කාර්යයන්හි විනිවිද භාවයක් ඇති කිරීමට.
- ✓ කළමනාකරුවන්ගේ එදිනෙදා කටයුතුවලින් වැඩි ප්‍රමාණයක් සන්නිවේදනය හා බැඳී පැවතීම.

<u>සංවිධානයක් තුළ සන්නිවේදනය සිදු වන ආකාර</u>

1) සිරස් සන්නිවේදනය
   - ❖ ඉහළ සිට පාහලට
   - ❖ පහළ සිට ඉහලට
2) තිරස් සන්නිවේදනය

විධිමත් සන්නිවේදනය : නිල සංවිධාන ව්‍යුහය තුළ ගලායන විනිවිද භාවයක් ඇති වාර්තාමය ස්වරූපයෙන් සිදු වන පිළිගත් පැහැදිලි පණිවිඩ හුවමාරු ක්‍රමයයි.
අවිධිමත් සන්නිවේදනය : නිල සංවිධාන ව්‍යුහයට බාහිරින් නිල වශයෙන් නොපිළිගන්නා විනිවිද භාවයක් නොමැති ව තොරතුරු ගලා යාම මඟින් සිදු වන සන්නිවේදනය අවිධිමත් සන්නිවේදනය ලෙස හැඳින්වේ.
අභ්‍යාස

01. සංවිධානයකට අවිධිමත් සන්නිවේදනය තුළින් අත්කරගත හැකි වාසි මොනවාද?
02. සංවිධානයකට අවිධිමත් සන්නිවේදනය තුළින් අත්විය හැකි අවාසි මොනවාද?
03. ඉහළ කලමනාකරණේ සිට පහළ කළමනාකරනය දක්වාත් , පහළ කළමනාකරණයේ සිට ඉහළ කළමනාකරණය දක්වාත් සන්නිවේදනය විය හැකි තොරතුරු වර්ග වෙන වෙනම දක්වන්න.